# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2312/12 – 2022 දෙසැම්බර් මස 27 වැනි අඟහරුවාදා – 2022.12.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, තෙන්මරාඩ් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/332 කෙට්පේලී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, විඩට්ටල් පලෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ja/CHV/2019/44 හා 2019.03.29 වන දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැලි වලට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' - මයිලිවඩ්ඩි - ප්‍රමාණයඃ හෙක්. 18.4198**
උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා), මූලික පිඹුර යා 1360 හි කැබලි අංක 1 සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා), කැබලි අක්ෂර B, නම නොදන්නා ඉඩම, හිමිකරු නොදන්නා විවෘත මුඩුබිම සහ මූලික පිඹුර යා 1360 හි කැබලි අංක 1; දකුණට: නම නොදන්නා ඉඩම, හිමිකරු නොදන්නා විවෘත මුඩුබිම සහ මූලික පිඹුර යා 1360 හි කැබලි අංක 1 මයිලිවඩ්ඩි, කනත්ත වත්ත සහ මූලික පිඹුර යා 1360 හි කැබලි අංක 1; බටහිරට: මූලික පිඹුර යා 1360 හි කැබලි අංක 1 මයිලිවඩ්ඩි, කනත්ත වත්ත, මූලික පිඹුර යා 1360 හි කැබලි අංක 1 සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

**02. කැබලි අක්ෂර 'C' - මයිලිවඩ්ඩි - ප්‍රමාණයඃ හෙක්. 1.4422**
උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා), සහ මූලික පිඹුර යා 1360 හි කැබලි අංක 1; නැගෙනහිරට: මාර්ගය, (ප්‍රාදේශීය සභා) සහ නම නොදන්නා ඉඩම, හිමිකරු නොදන්නා විවෘත මුඩුබිම; දකුණට: නම නොදන්නා ඉඩම, හිමිකරු නොදන්නා විවෘත මුඩුබිම සහ කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2013/D/92.
2022 ජනවාරි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 - 0344

1A – G 38445 – 32 (2022/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

*මගේ අංකය*: 03J/78/E/206.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: YAK/LAN/01/03/17.

අංක 394/11 හා 1986.03.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයේ ''සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ග/අ 78/61 දරණ ප්‍රගමණ අනුරේඛණයේ පෙන්නුම් කරන ලද ප්‍රමාණයෙන් අක්කර 1 රූඩ් 0 පර්චස් 00ක් පමණ වූ පහත සඳහන් මායිම් තුල පිහිටි කැබලි අංක 'අ' දරන කිට්වලගලවත්ත *නොහොත්* කිටිගලහේන නැමැති ඉඩම් කොටස '' යන්න වෙනුවට ''සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ග/අ 78/61 දරන ප්‍රගමණ අනුරේඛණයේ පෙන්නුම් කරන ලද ප්‍රමාණයෙන් අක්කර 1 රූඩ් 0 පර්චස් 00ක් පමණ වූ පහත සඳහන් මායිම් තුල පිහිටි කැබලි අංක 'අ' දරණ කළුගලවත්ත *නොහොත්* කළුගලහේන නැමති ඉඩම් කොටස'' ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 -0345